# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2378/51 – 2024 අප්‍රේල් මස 06 වැනි සෙනසුරාදා – 2024.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 17 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2015/IR/307-H.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/3/2/3/ව.ප.ඇ./ව්‍යා.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තිය (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, ගලේවෙල.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, හොම්බාව (E431A) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හොම්බාව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 335, අතිරේක අංක 31 හා පත්‍ර අංක 22 හා 2018.09.05 දිනැති අවසාන ගම් පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

1. කැබලි අංක 1337 – **බුළුගහමුලයාය – ප්‍රමාණය: හෙක්. 0.0219**

උතුරට: කැබලි අංක 1316, 1336 සහ 1333; නැගෙනහිරට: කැබලි අංක 1333 සහ 1334; දකුණට: කැබලි අංක 1335 සහ 1338; බටහිරට: කැබලි අංක 1338 සහ 1314.

EOG 04 – 0059

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 (අ) අතුරු විධාන ආඥාව

**2023 අංක 322 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2023/RE/106.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/MN/LB/05/AQ/SEA/WPP/PHII/10.

අංක 2362/52 හා 2023.12.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවෙහි සිංහල හා දෙමළ භාෂාවෙන් පළ කරන ලද දැන්වීම්වල උපලේඛනයේ ඉඩමේ විස්තරයෙහි සඳහන් ප්‍රගමන අනුරේඛනයෙහි අංක "MN/MNN/2023/569" යන්න වෙනුවට "MN/MNN/2023/568" ලෙස මුද්‍රණ දෝෂයකින් සටහන් වී ඇත. එබැවින් උක්ත *ගැසට් පත්‍රයේ* සිංහල හා දෙමළ භාෂාවෙන් පළ කරන ලද දැන්වීම්හි ප්‍රගමන අනුරේඛනයෙහි අංක "MN/MNN/2023/568" යන්න වෙනුවට "MN/MNN/2023/569" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 මාර්තු මස 14 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 – 0060

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.